<u>අයගම ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූලධන ලැබීම් වලදී කොන්ත්‍රාත්කරුට ගෙවන වටිනාකම පමණක් ආදායමට ගැනීමේදී රඳවුම් වටිනාකම වූ රු. 531,636 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන දීමනා වශයෙන් සභිකයින් 09 දෙනෙකු සඳහා සම්පූර්ණ වටිනාකම හෙවත් රු. 45,000 ක් ගෙවා ඇති නමුත් සභිකයින්ට හිමි වියයුතු වන්නේ දින 15 ක් සඳහා වන ඉන්ධන දීමනාව පමණි. ඒ අනුව කාර්යය මණ්ඩල නොවන ඉන්ධන වැය ශීර්ෂයේ වියදම රු. 22,500 කින් වැඩියෙන් දක්වා තිබූ අතර, මන්ත්‍රීවරුන්ගෙන් අයකර ගතයුතු රු. 22,500 ගිණුම් මගින්ද හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු. 46,653 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හරහා ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ වන්දි වශයෙන් ලද රු. 77,759 ක් ආදායමට නොගෙන තැන්පත් ගිණුම මගින් වියදම් කිරීමෙන් වර්ෂයේ ආදායම සහ වියදම ඉහත අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) එකතුව රු. 52,656,402 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචික වර්ෂයේ මැයි 15 දිනෙ සභාවේ නිල කාලය අවසන් වී තිබූ අතර, සභිකයින් වෙත මැයි මස සඳහා මන්ත්‍රී දීමනා වශයෙන් රු.150,000 ක් ගෙවා ඇති නමුත් ප්‍රතිපූර්ණය වී තිබුණේ ඔවුන්ට හිමි දින 15 දීමනාව පමණි. ඒ අනුව වැටුප් වියදම් රු.75,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර, ප්‍රාදේශීය සභාව විසින් මන්ත්‍රීවරුන්ගෙන් අය කර ගතයුතු රු.75,000 ගිණුම් මගින් හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 8,533,138 ක් විය

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වන වගන්තිය | සභා සීමා සතු මාර්ග විධිමත් ලෙස හඳුනාගෙන මැනීම් සිදුකර ගැසට් පත්‍රයේ පලකර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කල යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 571 | රු. 679,205 ක් වටිනාකමැති කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 1,588,026 ක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු. 4,360,166 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 5,948,192 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 136 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම්හි වැඩිවීමයි .

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 485 | 638 | 292 |
| බදු කුලී | 3,471 | 3,255 | 322 |
| බලපත්‍ර ගාස්තු | 363 | 423 | 10 |
| වෙනත් ආදායම් | 22,211 | 23,088 | 6,404 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් දෙකක රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 11 ක සහ සියයට 28 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 61,937 ක වරිපනම් බදු අයවීමට තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව ඉහත හිඟ වරිපනම් බදු අයකර ගැනීම උදෙසා දේපල තහනම් කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීම සඳහා යොමුවී නොතිබුණි.

2.3.4 බදුකුලී

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වර්ෂ ගණනාවක් සිට හිඟව පවතින රු. 75,519 ක් හිඟ අක්කර බදු අයවීමට තිබුණි.

2.3.5 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ආදායම් වලට අදාලව ආදායම් ලේඛණ පවත්වාගෙන යනු ලබන්නේ ආයතනයට ව්‍යාපාර වර්ගය අනුව එකතුවන ආදායම පදනම් කරගෙන පමණක් බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය සම්බන්ධයෙන් විධිමත් සවිස්තරාත්මක ලේඛණයක් නඩත්තු කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් දැන්වීම් පුවරු ප්‍රදර්ශනයට අදාලව කිසිදු ආදායමක් සභාව වෙත ලැබී නොතිබූ බවද අනාවරණය විය.

(ඇ) ත්‍රීරෝද රථ ගාල් කිරීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නියමිත ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අයගම සතිපොල ඌරුමස් කඩය රු. 60,900 ක වාර්ෂික බදු මුදලකට ලබාදී තිබුණද, 2015 අප්‍රේල් 06 දින සිට වසා දමා තිබුණි. ඒ අනුව සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී ගොස් ඇති බව නිරීක්ෂණය විය. එසේම පහල ගලතුර සතිපොල මාළු කඩය රු. 171,000 ක වාර්ෂික බදු මුදලකට බදු ලබාදී තිබුණද, පෙබරවාරි මසින් පසු වෙළඳසැල අක්‍රීය වී තිබුණි. ඒ අනුව සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී ගොස් තිබුණි.

(ඉ) 2014 ඔක්තෝබර් 31 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1887 දරණ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි කලායතන ශාලාව රු. 1,500 ක දෛනික ගාස්තුවක් මත කුලියට ලබා දීමට ප්‍රකාශ කර තිබුණද, 2015 වර්ෂය සඳහා අවස්ථා 09 කදී රු. 7,500 ක් වැනි සුළු මුදලක් ආදායම් වශයෙන් උපයා තිබුණි. මෙම රංග ශාලාවේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මසදී රු. 1,719,900 ක මුදලක් වැය දරා තිබුණද, විගණිත දිනය වනවිටත් එකී ශාලාවෙන් වැඩි ආදායමක් උත්පාදනය කර ගැනීම උදෙසා විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් අනුගමනය කර නොතිබුණි

2.3.6 දුරකථන කුළුණු ගාස්තු

---------------------------

සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති හෝ අළුතින් ස්ථාපිත කරන විදුලි සංදේශ කුළුණු සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය පරිදි නියමිත ගාස්තු අයකල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේ සිට අධිකරණය වෙතින් ලැබිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2014 දෙසැම්බර් සිට 2015 ජූනි මස දක්වා ලැබිය යුතු රු. 574,167 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2014 සැප්තැම්බර් මාසයේ සිට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට හෝ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 අවිධිමත් ගණුදෙණු

--------------------

අංක WP PF – 5488 දරණ කැබ් රථය, මාර්ග තලනය, අංක SG RC – 1401 දරණ ට්‍රැක්ටරය, අංක SG GE – 8582 හා LF – 4833 දරණ කැබ් රථය සඳහා රු. 459,905 ක් වටිනා අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් එකී අළුත්වැඩියාව සිදු කිරීමට පෙර හා අළුත්වැඩියාවෙන් පසු විධිමත් පරිදි කාර්මික නිලධාරියෙකුගේ සහතික කිරීමක් නොතිබුණි

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකු ගෙන් රු. 25,200 ක හිඟ ණය ශේෂයක් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 21 දින වනවිටද අයකරගෙන නොතිබුණි.

3.3 අක්‍රිය ගිණුම්

--------------

පුස්තකාල ඇප තැන්පත් ගිණුමේ රු. 170,785 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර, එම ශේෂය දීර්ඝ කාලීන ශේෂයකි. උක්ත තැන්පතු ඉකුත් වූ තැන්පතුවක් වශයෙන් ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සභාව වෙත ලැබී ඇති මෝටර් ග්‍රේඩරය හා අංක LK – 9601 දරණ ලේලන්ඩ් වර්ගයේ ටිපර් රථය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලද කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා ප්‍රාදේශීය සභා මාර්ගයන්හි ධාවනය කිරීමට තරම් මාර්ග සතුටුදායක නොවීම මත නිෂ්කාර්යයව සභා භූමියේ රඳවා තිබුණි.

ii. 2015 මැයි 20 දින රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳව අමාත්‍යාංශය මඟින් ලැබූ අංක WP ZA – 5020 දරණ බැකෝ ලෝඩරය ක්‍රියාකරුවෙකු නොමැති හෙයින් නිෂ්කාර්යයව සභා භූමියේ රඳවා තිබුණි.

iii. 2015 වර්ෂය තුල කුට්ටිගල් අතුරා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 4,249,925 ක මුදලක් ගෙවා තිබුණි. කොන්ක්‍රීට් කුට්ටි ගල් සකස් කිරීමේ යන්ත්‍රයක් සභාව සතුව පැවතියද, එකී යන්ත්‍රය වර්ෂයක පමණ කාලයක් තිස්සේ අක්‍රීයව පැවතීම හේතුවෙන් මෙසේ සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

-------------------------------

සභාව සතු වාහන හා යන්ත්‍ර උපකරණ 04 ක් අබලන් තත්තවයේ පවතින බවත්, එකී වාහන ගර්හිත තත්ත්වයේ සේ සලකා අපහරණය කිරීමට 2015 පෙබරවාරි 20 දින මහ සභා රැස්වීමේදී තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ඒ පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන සභා භූමියේ රඳවා තිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
-----------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------
සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------
අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
---------------------------------------------------------
විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
-----------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය